(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 98.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2019 සැප්තැම්බර් 19 වැනි බ්‍රහස්පතින්දා පූ.භා. 10.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා,** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **පලනි දිගම්බරම් මහතා,** කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **හරින් ප්‍රනාන්දු මහතා,** විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යතුමිය

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා

ගරු **තිලක් මාරපන මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මංගල සමරවීර මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජේ. සී. අලවතුවල මහතා,** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රංජිත් අලුවිහාරේ මහතා,** සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලකී ජයවර්ධන මහතා,** නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **බුද්ධික පතිරණ මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සෙය්යිඩ් අලි සාහීර් මවුලානා මහතා,** ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අජිත් මාන්නප්පෙරුම මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වඩිවේල් සුරේෂ් මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එඩ්වඩ් ගුණසේකර මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් බණ්ඩාර ජයමහ මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**

ගරු **මහින්ද අමරවීර මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා**

ගරු **ලසන්ත අලගියවන්න මහතා**

ගරු **ආනන්ද අලුත්ගමගේ මහතා**

ගරු **(ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා**

ගරු **ටී. බී. ඒකනායක මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා**

ගරු **චන්දිම ගමගේ මහතා**

ගරු **උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා**

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**

ගරු **පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු එස්. බී. නාවින්න මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු මුහම්මදු නසීර් මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු සුජීත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු පාලිත රන්ගේ බණ්ඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරානාත් බස්නායක මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බිමල් රත්නායක මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු අංගජන් රාමනාදන් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු එස්. වියාලේන්දිරන් මහතා

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**

**ගරු විමල් වීරවංශ මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු මහින්ද සමරසිංහ මහතා**

**ගරු සන්දිත් සමරසිංහ මහතා**

**ගරු ඊ. සරවනපවන් මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා**

**ගරු මුත්තු සිවලිංගම් මහතා**

**ගරු තිලංග සුමතිපාල මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**

**ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු විජිත් විජයමුණි සොයිසා මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු එච්. එම්. එම්. හරීස් මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු ඩී. බී. හේරත් මහතා**

**ගරු මනෝජ් හේවාගම්පලගේ මහතා**

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**

**ගරු ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2018 වර්ෂය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2015 වර්ෂය සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව කාන්තා හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් පිළිගන්වා, එම වාර්තාව සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2018 වර්ෂය සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. කාරක සභා වාර්තා පිළිගැන්වීම** : රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා වෙනුවෙන් එහි සාමාජික මන්ත්‍රී ගරු බිමල් රත්නායක මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද, ''හානිපූරණය සඳහා වන කාර්යාලය පනත යටතේ තීරණය'' සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම :**

> දැරණියගල, මාලිබොඩ, පේරුපල්ල යන ලිපිනයෙහි පදිංචි ආර්. මහින්ද මහතාගෙන් ලැබුණු 2019.07.23 දිනැති පෙත්සම ගරු වාසුදේව නානායක්කාර මහතා විසින් පිළිගන්වන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 30(10) යටතේ එම පෙත්සම, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. මහජන බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත :** කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය (2019 අගෝස්තු 22) ,—

''පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය'' ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදින්, විවාදය තවදුරටත් පවත්වන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය''යි මුදල් අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සභා සම්මත විය.

2 වැනි වගන්තිය

මුදල් අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 1 වැනි පිටුවේ, 13 වැනි පේළිය, ඉවත් කර පහත පරිදි ආදේශ කිරීමට : —

''(2) (අ) ජාතික ආර්ථිකයේ යහපත පිණිස''

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා යෝජනා කළ සංශෝධනයක් :

1 වැනි පිටුවේ, 18 වැනි පේළියේ සිට 20 වැනි පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර පහත පරිදි ආදේශ කිරීමට : —

> "ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වැනි වගන්තිය ඉවත් කිරීමේදී 12.(2) (ආ) උපවගන්තියේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියමයක්ම යන වචනයෙන් පසු 'දින 60ක් ගත වීමට පෙර අනිවාර්යෙන්ම අනුමතිය ලබා ගත යුතුය. පාර්ලිමේන්තුව වෙත දින 30ක් ඇතුලත ඉදිරිපත් කළ යුතුය'."

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ඊට අනුකූලව, මුදල් අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනය :

"අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියමයක්ම ගැසට් පත්‍රයේ පළ කළ දින සිට දින අනූවක් තුළ පාර්ලිමේන්තුවේ අනුමතය ලබා ගත යුතු ය."

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3 වැනි වගන්තිය

මුදල් අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක් : 2 වැනි පිටුවේ, 3 වැනි පේළියේ සිට 11 වැනි පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර පහත පරිදි ආදේශ කිරීමට:—

> " "මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීන ණය ප්‍රදානය කිරීම සඳහා ණයකර නිකුත් කිරීම මඟින් බැංකුව විසින් මුදල් රැස්කරනු ලැබිය හැකි බව.
>
> 20. (1) දීර්ඝ කාලීන සහ මධ්‍ය කාලීන ණය ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා 15 (1) (ආ) වගන්තිය යටතේ බැංකුව වෙත රජය විසින් ණයට දෙනු ලබන මුදල්වලට අතිරේකව, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව බැංකුව විසින් ණයකර නිකුත් කිරීම මඟින් මුදල් රැස්කරනු ලැබිය හැකි ය.
>
> (2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, "අමාත්‍යවරයා" යන්නෙන්, මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ."."

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා යෝජනා කළ සංශෝධනයක්: 2 වැනි පිටුවේ, 1 වැනි සහ 2 වැනි පේළි ඉවත් කර පහත පරිදි ආදේශ කිරීමට:—

> "ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වැනි වගන්තිය ඉවත් කිරීම යන සංශෝධන සම්පූර්ණයෙන්ම ඉවත් කළ යුතුය."

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා යෝජනා කළ සංශෝධනයක්: 2 වැනි පිටුවේ, 3 වැනි පේළියේ සිට 11 වැනි පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර පහත පරිදි ආදේශ කිරීමට:—

> "20(1) (අ) "දීර්ඝකාලීන සහ මධ්‍යකාලීන ණය ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා 15(1)(ආ) වගන්තිය යටතේ බැංකුව වෙත රජය විසින් ණයට දෙනු ලබන මුදල්වලට අතිරේකව, අමාත්‍යවරයාගේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අනුමතිය ඇතිව බැංකුව විසින් ඍණපත්‍ර නිකුත් කිරීම මඟින් මුදල් රැස්කරනු ලැබිය හැකිය."

20(1) (ආ) ඉහත (අ) යටතේ නිකුත් කරනු ලබන සෘණ පත්‍ර කිසිදු අයුරකින් බැංකුවේ කොටස් බවට පරිවර්තනය කළ නොහැක්කේය.

20(2) ඉහත (1) වැනි උප වගන්තියේ කාර්යය සඳහා "අමාත්‍යවරයා" යන්නෙන් මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ."

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු බිමල් රත්නායක මහතා යෝජනා කළ සංශෝධනයක්: 2 වැනි පිටුවේ, 6 වැනි පේළියේ "මුදල්වලට අතිරේකව" යන වචනවලට ඉක්බිතිවම, "මුදල් මණ්ඩලයේ අනුමතිය ඇතිව" ඇතුළත් කිරීමට.

ගරු බිමල් රත්නායක මහතා යෝජනා කළ තවත් සංශෝධනයක්: 2 වැනි පිටුවේ, 11 වැනි පේළියට ඉක්බිතිවම පහත පරිදි එකතු කිරීමට:—

"මෙම සෘණපත්‍ර, කොටස් බවට හෝ වෙනත් හුවමාරු කළ හැකි මූල්‍ය උපකරණ බවට පත් කළ නොකළ යුතුය"

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"සංශෝධන පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, පාර්ලිමේන්තුව මතු පළවන අන්දමට පක්ෂව 37; විරුද්ධව 72; යනුවෙන් බෙදී, එය නිෂ්ප්‍රභ විය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ආ) අනුකූලව විද්‍යුත් ඡන්ද විමසීම් ක්‍රමය භාවිතයෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් එකසිය අට (108) දෙනෙක් පහත සඳහන් ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| O 002. Sumedha G. Jayasena | Yes |
| O 005. Dinesh Gunawardana | Yes |
| O 006. Nimal Siripala de Silva | Yes |
| O 007. Chamal Rajapaksa | Yes |
| O 009. Mahinda Amaraweera | Yes |
| O 012. Anura Priyadharshana Yapa | Yes |
| O 015. A.D. Susil Premajayantha | Yes |
| O 022. Bandula Gunawardana | Yes |
| O 023. Mahinda Samarasinghe | Yes |
| O 028. Mahinda Yapa Abeywardena | Yes |
| O 031. Kumara Welgama | Yes |
| O 043. Vasudeva Nanayakkara | Yes |
| O 048. Chandima Weerakkody | Yes |
| O 051. Udaya Prabhath Gammanpila | Yes |
| O 052. Susantha Punchinilame | Yes |
| O 053. Lasantha Alagiyawanna | Yes |
| O 055. Thilanga Sumathipala | Yes |
| O 057. K. Thurairetnasingam | No |
| O 059. Sunil Handunnetti | Yes |
| O 060. Bimal Rathnayake | Yes |
| O 061. Sudarshini Fernandopulle | Yes |

| | |
|---|---|
| O 067. S.C. Mutukumarana | Yes |
| O 073. Nimal Lanza | Yes |
| O 076. K. Kader Masthan | Yes |
| O 080. Nalinda Jayathissa | Yes |
| O 081. Angajan Ramanathan | Yes |
| O 082. Ananda Aluthgamage | Yes |
| O 086. Jayantha Samaraweera | Yes |
| O 089. Mohan Priyadarshana De Silva | Yes |
| O 103. Shehan Semasinghe | Yes |
| O 104. Kanaka Herath | Yes |
| O 105. D.V. Chanaka | Yes |
| O 108. Sanath Nishantha Perera | Yes |
| O 112. Prasanna Ranaweera | Yes |
| O 114. Kanchana Wijesekara | Yes |
| O 115. Indika Anuruddha Herath | Yes |
| G 001. Rauff Hakeem | No |
| G 002. Mangala Samaraweera | No |
| G 004. John Amaratunga | No |
| G 005. Gayantha Karunatileka | No |
| G 006. Lakshman Kiriella | No |
| G 007. Ranil Wickremesinghe | No |
| G 009. Tilak Marapana | No |
| G 011. Ravi Karunanayake | No |
| G 012. Rajitha Senaratne | No |
| G 014. Patali Champika Ranawaka | No |
| G 015. Kabir Hashim | No |
| G 016. Sajith Premadasa | No |
| G 018. Malik Samarawickrama | No |
| G 020. Navin Dissanayake | No |
| G 023. R.M. Ranjith Madduma Bandara | No |
| G 025. Palany Thigambaram | No |
| G 026. Chandrani Bandara | No |
| G 027. Thalatha Atukorale | No |
| G 028. Abdul Haleem | No |
| G 029. Sagala Ratnayake | No |
| G 032. Ravindra Samaraweera | No |
| G 033. Sujeewa Senasinghe | No |
| G 039. Lucky Jayawardana | No |
| G 041. Dilip Wedaarachchi | No |
| G 042. Niroshan Perera | No |
| G 044. Wasantha Aluwihare | No |

| | |
|---|---|
| G 045. Vijayakala Maheswaran | No |
| G 046. Eran Wickramaratne | No |
| G 047. Ranjith Aluvihare | No |
| G 048. J.C. Alawathuwala | No |
| G 049. Vadivel Suresh | No |
| G 052. Ashok Abeysinghe | No |
| G 053. Seyed Ali Zahir Moulana | No |
| G 054. Ajith Mannapperuma | No |
| G 055. Buddhika Pathirana | No |
| G 057. Edward Gunasekara | No |
| G 058. Karunarathna Paranawithana | No |
| G 060. Nalin Bandara Jayamaha | No |
| G 062. A.H.M. Fowzie | No |
| G 064. Lakshman Senewiratne | No |
| G 065. Wijith Wijayamuni Zoysa | No |
| G 067. Field Marshal Sarath Fonseka | No |
| G 068. Indika Bandaranayake | No |
| G 069. Palitha Range Bandara | No |
| G 070. H.M.M. Harees | No |
| G 071. M.S. Thowfeek | No |
| G 075. K.K. Piyadasa | No |
| G 076. Lakshman Ananda Wijemanne | No |
| G 081. A. Aravindh Kumar | No |
| G 083. Nalaka Prasad Colonne | No |
| G 084. Chandima Gamage | No |
| G 085. Kavinda Heshan Jayawardana | No |
| G 088. Sujith Sanjaya Perera | No |
| G 089. Hirunika Premachandra | No |
| G 090. Bandula Lal Bandarigoda | No |
| G 091. M. Ibrahim Muhammad Mansoor | No |
| G 092. S.M. Marikkar | No |
| G 093. Imran Maharoof | No |
| G 094. Ishak Rahuman | No |
| G 095. Mujibur Rahuman | No |
| G 096. Harshana Rajakaruna | No |
| G 097. Thusitha Wijemanna | No |
| G 098. Rohini Kumari Wijerathna | No |
| G 099. Chaminda Wijesiri | No |
| G 100. Hesha Withanage | No |
| G 101. Sandith Samarasinghe | No |
| G 103. Wijepala Hettiarachchi | No |

| | |
|---|---|
| G 104. Ashu Marasinghe | No |
| G 105. Jayampathy Wickramaratne | No |
| G 106. Mohamadu Nazeer | No |
| G 115. D.B. Herath | Yes |
| G 116. Manoj Hewagampalage | Yes |

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ඈ) අනුකූලව මහ ලේකම්වරයා විසින් පහත සඳහන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ නම විමසීමෙන් පහත ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| G 003. Gamini Jayawickrama Perera | No |

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

4 වැනි වගන්තිය සභා සම්මත විය.

5 වැනි වගන්තිය

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා යෝජනා කළ සංශෝධනයක්: 2 වැනි පිටුවේ 5 වැනි වගන්තියට ඉක්බිතිවම මතු සඳහන් පරිදි ඇතුළත් කිරීමට:—

" 'ආ' නිකුත් කරනු ලබන කිසියම් සෘණපත්‍රයක් හෝ ණයකරයක් මාරු කිරීමට (convertible) නොහැකිය."

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

5 වැනි වගන්තිය සභා සම්මත විය.

6 වැනි වගන්තිය සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය හා නාමය

"ප්‍රඥප්ති වගන්තිය හා නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වැනි වර කියවිය යුතුය"යි මුදල් අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය :** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතියට යටත්ව 2019.04.26 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න මහතා විගණකාධිපතිවරයා වශයෙන් පත්කර ඇති හෙයින්ද;

විගණකාධිපතිවරයාගේ වැටුප 153(2) ව්‍යවස්ථාව අනුව, පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන අතර ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන හෙයින් ද;

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින්, 2019 ජූනි 24 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට 2019 ජූලි 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විගණකාධිපති ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න මහතාට 2019.04.26 දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි SL – 4 වැටුප් ක්‍රමයෙහි 7 පියවරෙහි පිහිටුවා වැටුප් ගෙවීම හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන අනුව තනතුරට හිමි අනෙකුත් දීමනා ගෙවීමටත් එම වැටුප් පරිමාණයට අනුව වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමටත් අනුමතිය ලබා දී ඇති හෙයින්ද;

ඊට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව අනුව, විගණකාධිපති ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න මහතා වෙත ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීම කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. හානිපූරණය සඳහා වන කාර්යාලය පනත යටතේ තීරණය :** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2018 අංක 34 දරන හානිපූරණය සඳහා වන කාර්යාලය පනතේ විධිවිධාන ප්‍රකාරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත පත්කර ගනු ලැබූ හානිපූරණය සඳහා වන කාර්යාලයේ සභාපතිවරයා ඇතුළු සාමාජිකයන් පස් දෙනෙකු සඳහා වැටුප් ලබා දීම, එකී පනතේ 17 වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර, එය ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු හෙයින්ද;

සංක්‍රාන්තික යුක්තිය ක්‍රියාවලියට දායකත්වය ලබා දීම සඳහා රජය විසින් පිහිටවනු ලැබූ මෙම කාර්යාලය, ප්‍රතිසංධානය අරමුණු කරගනිමින් ගැටුම් හේතුවෙන් පීඩාවට පත් තැනැත්තන්ට තනි හා සාමූහික හානිපූර්ණයන් ප්‍රදානය කිරීම සඳහා හානිපූරණය පිළිබඳ ප්‍රතිපත්තීන් විධිමත්ව සකස්කර අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ කිරීම, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ලබාදෙන නිර්දේශ ක්‍රියාවට නැංවීම, හානිපූරණ ප්‍රතිපත්ති අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් අනතුරුව ක්‍රියාත්මක කිරීම, පීඩාවට පත් තැනැත්තන් කිසිදු වෙනස්කමකට පාත්‍ර නොකරමින් ඔවුන් හට ප්‍රතිෂ්ඨාපනය, පුනරුත්ථාපනය, පරිපාලන ඇතුළු අනෙකුත් සහන ලබා දීම හා සුබසාධන සේවා සැපයීම සිදු කිරීමට බලය පැවරී තිබෙන හෙයින්ද;

ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන හා යෞවන කටයුතු විෂය භාර අමාත්‍යවරයා වශයෙන් අග්‍රාමාත්‍යවරයා විසින් 2019 මැයි 16 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව 2019 ජූනි 04 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී හානිපූරණය සඳහා වන කාර්යාලයේ සභාපතිවරයාට සහ අනෙකුත් සාමාජිකයන්ට 2019 අප්‍රේල් 01 දින සිට බලපවත්වන ලෙස පහත සඳහන් පරිදි වැටුප් සහ දීමනා ගෙවීමට තීරණය කරන ලද හෙයින්ද:—

(අ) මෙම කාර්යාලයේ සභාපතිවරයාට රු.135,000/- ක මාසික දීමනාවක්, රු.10,000/-ක මාසික දුරකථන දීමනාවක් සමඟ මසකට ලීටර් 225 ක ඉන්ධන සලාකයක් සහිතව නිල වාහනයක් ලබාදීම; සහ

(ආ) මෙම කාර්යාලයේ අනෙකුත් සාමාජිකයන්ට රු.90,000/-ක මාසික දීමනාවක්, රු. 8,000/- ක මාසික දුරකථන දීමනාවක් සහ නිවසේ සිට කාර්යාලය වෙත ඇති දුර මත පදනම්ව කි.මී. 350 ක සීමාවක් දක්වා රු. 25,000/- ක් හෝ කි.මී. 350 ක් හෝ ඊට වැඩි දුර ප්‍රමාණයක් සඳහා රු. 50,000/- ක මාසික ප්‍රවාහන දීමනාවක් ලබා දීම.

ඊට අනුකූලව, 2018 අංක 34 දරන හානිපූරණය සඳහා වන කාර්යාලය පනතේ 17 වගන්තිය ප්‍රකාරව හානිපූරණය සඳහා වන කාර්යාලයේ සභාපතිවරයාට සහ අනෙකුත් සාමාජිකයන්ට ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ඉහත සඳහන් වැටුප් සහ දීමනා, 2019 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ගෙවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. කල් තැබීම (සරසවි අනධ්‍යයන සේවක වැටුප් විෂමතා) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

(අ.භා. 1.30 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 2.18 ට, 2019 සැප්තැම්බර් 20 වැනි සිකුරාදා පූ.භා. 10.30 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.